# සන්ෆෝ නියෝජිතයෝ මැනිලා සමුළුවට එතෙර යති

පිලිපීනයේ මැනිලා නුවරදී අප්‍රේල් 05 වන දින ඇරැඹි එක්සත් ජාතීන්ගේ පරිසර වැඩසටහනේ (UNEP) ආසියා පැසිපික් මූල්‍ය සේවා සමුළුවට සහභාගිවීමට ශ්‍රී ලංකා එක්සත් ජාතීන් මිත්‍රත්ව සංවිධානයේ (සන්ෆෝ) සම්බන්ධීකාරක නිලධාරීන් වන එච්. මාලින්ද අනුර මෙන්ඩිස් සහ ගාමිණී ජයසිරි ගුණවර්ධන යන මහත්වරු දිවයිනෙන් පිටත්ව ගියහ.

පසුගිය වසරේ ඔස්ට්‍රේලියාවේ මෙල්බෝන් නුවර පැවැති සමුළුවේ වාර්තා අධ්‍යයනය කරමින් 21 සියවසේ ආසියා පැසිපික් කලාපයේ ස්ථායි සංවර්ධනයට නව ප්‍රමුඛතා අභියෝග සහ අවකාශ හඳුනා ගැනීමටත් ISO 14001කරා යාමේ උපාය මාර්ග සැලසුම් කිරීමටත් මෙම සමුළුවේ කාර්යන් අතරට එක් විය.

සියලු ආසියා පැසිපික් රටවල් නියෝජනය කරමින් ඉහළ පෙළේ නියෝජිතයින් 200 පමණ ඇරයුම් ලබා ඇති මෙම සමුළුවට පිලිපීනයේ ජනාධිපතිනිය ද සහභාගි වූවාය.

සන්ෆෝ අධ්‍යක්ෂ ජෙනරාල් සාමතානාපති ආචාර්ය දේශප්‍රිය එස්. විජේතුග මහතා, මාලින්ද අනුර මෙන්ඩිස් සහ ශාන්ත ජයසිරි



ගුණවර්ධන මහත්වරු සමුළුවට ඉදිරිපත් කරන වාර්තාව පිරිනමන අවස්ථාව ඡායාරූපයේ දැක්වේ.